# සුභාශිංසන

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ හා මධ්‍යම පළාත් වනිතා කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි අකුරණ කොට්ඨාශයේ ප්‍රථම මුස්ලිම් කාන්තා කාර්ය සංවිධානය වශයෙන් අකුරණ අව්වා කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් විසින් දරණ ලද මෙම ප්‍රයත්නය ඉතා අගය කොට සළකමු.

විවිධ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී මොවුන්ගේ සහභාගිත්වය, උද්යෝගය හා කැපවීම හැමවිටම ප්‍රශංසනීය විය. ඒ ලබාගත් අත්දැකිම් හා පන්නරය ඔස්සේ කරන ලද මෙම ප්‍රථම නිර්මාණ එළිදැක්ම බෙහෙවින් සාර්ථක වි තිබෙන බව කිවයුතුය. ඒ සඳහා යම් සහයෝගයක් හා මඟපෙන්වීමක් අපටද කල හැකිවීම පිළිබඳව අපි හදවතින්ම සතුටු වන්නෙමු.

කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් වශයෙන් මොවුන් කෙටි කලක් තුළ ලබාගත් දැනුම, අත්දැකිම හා ජයග්‍රහණ ඉමහත්ය. මේ කාර්යයද එහි ප්‍රතිඵලයකි. මේ තුළ අන්තර්ගත ලිපිමාලාවෙන් ලබාගත හැකි දැනුම විශාලය. එය අගනා නිර්මාණ එකතුවකි. මේ වෑයම තුළින් ඉදිරියේදි තවත් විශිෂ්ට නිර්මාණ එළිදැක්වීමට ඔවුන්ට හැකිවේවි. මේ ඔබලාගේ ප්‍රථම පියවර සඳහා අපේ හෘදයාංගම සුභ පැතුම් එක්කරමින් සියලු ජය ප්‍රාර්ථනා කරමු.

ප්‍රභාෂිණී ජයසිංහ
වනිතා සංවර්ධන නිලධාරි
ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
අකුරණ

නදීරා දීගල,
වැඩසටහන් සහකාර (වනිතා)
ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
අකුරණ.